## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ඖෂධ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තතත්වයක් පිළබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙත සැපයූ ඖෂධවලට අදාලව පෙර වර්ෂ පහක සහ සමාලෝචිත වර්ෂයට අදාල රු.208,143,509 ක හර පත්‍ර ගිණුම් ගත නොවීම හේතු කොටගෙන සමාලෝචිත වර්ෂයේ ඒ හා සමාන වටිනාකමකින් ණය ගැතියන්ද, රු.19,890,083 කින් ණයට විකුණුම්ද අඩුවෙන් ගිණුම්වල පෙන්වා තිබුණි.

(ආ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සඳහා වන මාර්ගස්ථ තොග තුල මත හේදයට ලක් වූ රු.175,092,481 ක තොග අන්තර්ගතව පැවතුණි.කෙසේ වෙතත් මේ තුල ඇති විකිණිය නොහැකි යැයි හදුනාගත් ශේෂ සඳහා රු.109,935,365 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි.

##### 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වසර අවසානයට අයකර ගත යුතු බහාලුම් තැන්පතු වටිනාකම රු. 7,226,842 ක් ව අතර එයින් රු. 3,722,648 ක් සමාලෝචිත වර්ෂයටද ඉතිරි රු.3,504,194, 2003-2010 වර්ෂවලට අදාල විය.

(ආ) මුළු වෙළඳ ණයගැති වටිනාකම වූ රු.4,730,606,130 න් රු. 3,937,579,457 ක් ම සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්ගෙන් ලැබිය යුතු ණය මුදල වූ අතර ඒ තුල වසර 1 ට වඩා වැඩි ණය ශේෂ රු.2,348,736,498 ක්ද වර්ෂ 05 ට වඩා පැරණි ණය ශේෂ රු. 301,056,701 ක් ද විය.

1.2.3 නීත,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රු.2,776,773 ක් වූ උපයන විට බදු සේවකයින්ගෙන් අය කරනු වෙනුවට සංස්ථා අරමුදලෙන් ගෙවා තිබුණි. |
| (ආ) 2006 මාර්තු 01 දිනැති අංක 09 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛය 2.9.1 වගන්තිය | ප්‍රධාන ප්‍රසම්පාදන කමිටු සභාපතිට හා සෙසු සාමාජිකයින්ට ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු. 3,000 හා රු. 2,000 ක් වුවද රු. 17,500 හා රු. 15,000 බැගින් ගෙවා තිබූ අතර සුළු ප්‍රසම්පාදන කමිටු සභාපතිට හා සෙසු සාමාජිකයන්ට ගෙවිය යුතු රු. 500 හා රු. 250 වෙනුවට රු. 12,500 සහ රු. 10,000 බැගින් දීමනා ගෙවා තිබුණි. |
| 2.9.1 වගන්තිය | සාමාන්‍ය රාජකාරි වේලාවන් තුල ප්‍රසම්පාදන කමිටු රැස්වීම් පවත්වා තිබුණි |
| 2.2.9 වගන්තිය | නිලධාරීන් 12 දෙනෙකුගේ වැටුපෙහි සාමාන්‍යය රු.289,913 කින් ඉක්මවා තිබුණද ප්‍රසම්පාදන කමිටුවල තවදුරටත් සිටින නිලධාරීන්ගේ ඉදිරි ප්‍රසම්පාදන කමිටු දීමනාවලින් එම වැඩිපුර ගෙවීම් වාරික වශයෙන් අයකරණු ලබයි. |
| 6.3.6 වගන්තිය | ලංසු විවෘත කිරීම සඳහා නියමිත ආකෘති පත්‍ර භාවිතා කර නොතිබූ අතර, එහි කමිටු සාමාජිකයින් අත්සන් කර නොතිබණි. |
| (ඇ) 2011 අංක 09 දරන එකතු කල අගය මත බදු (සංශෝධන) පනත | 2010 දෙසැම්බර් 31 දිනට අඩුකළ යුතු යෙදවුම් බද්ද වෙනුවට මුළු යෙදවුම් බද්දම අඩුකර ගෙවා තිබීමෙන්, 2011 පළමු කාර්තුවට අදාල රු. 28,425,110 ක එකතු කල අගය මත බදු වගකීම පැහැර හැර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.14.1 | රු.100,909,346 ක් වටිනා cellulose wadding BP (1998) in 500g rolls මිලදී ගැනීමට අදාල තීරණය අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කිරීමට පෙර සංස්ථාව විසින් ඇනවුම් කර තිබුණි. මීට අදාල නිළධාරියා වැඩ තහනමකට ලක් කර දැනට විනය පරීක්ෂණයක් පවත්වන බව සභාපති දැනුම් දී ඇත. |

### 1.2.4 ද්‍රාශ්‍ය අක්‍රමිකතා හා අවිධිමත් ගනුදෙනු

තත්ත්වයෙන් බාල වීම මත වෛද්‍ය සැපයීම් අංශය ප්‍රතික්ෂේප කළ Ampicillin Injection BP250 mg ඖෂධය සඳහා වූ රු. 10,454,080 ක වියදම අදාල සැපයුම්කරුගෙන් අයකර ගැනීමක හෝ තත්ත්වයෙන් බාල ඖෂධ වෙනුවට නව අයිතම ලබා ගැනීමක් හෝ සිදු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය බදු වලට පෙර රු. 515,843,207 ක ශුද්ධ ලාභයක් වූ අතර, එය ඉකුත් වර්ෂය සඳහා බදුවලට පෙර ශුද්ධ ලාභය වූ රු. 483,774,625 සමඟ සැසඳීමේදී රු. 32,068,582 ක වැඩි වීමක් පෙන්නුම් කෙරුණි.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය වියදම වූ රු. 422,895,753 ක වටිනාකම අඩු කිරීමට පෙර සංස්ථාව විසින් රු. 938,738,960 ක මෙහෙයුම් ලාභයක් උපයා තිබූ අතර එය පසුගිය වර්ෂයේ මූල්‍ය පිරිවැය අඩු කිරීමට පෙර මෙහෙයුම් ලාභය රු. 816,578,399 සමඟ සැසඳීමේදී රු. 122,160,561 ක මෙහෙයුම් ලාභය වැඩි වීමකි.

සංස්ථාවේ සමාලෝචිත වර්ෂයෙ දළ ලාභ අනුපාතය 11.14% ක්වූ අතර එය පසුගිය වර්ෂයෙහි 11.59% ක් විය. එමෙන්ම සමාලෝචිත වසරේ ශුද්ධ ලාභ අනුපාතය 1.59% ක් වූ අතර ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය1.25% විය.

සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ ලාභය වැඩිවීමට බලපෑ හේතූන් වූයේ විකුණුම්වල රු. 2,161,813,332 ක වර්ධනය සහ ප්‍රතික්ෂේපිත තොග වෙනුවෙන් සැපයුම්කරුවන්ගෙන් රු. 46,504,669 ක් නැවත අය කර ගැනීම යි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) (i) මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ වැදගත් දත්ත ඉකුත් වර්ෂයට අදාල අනුරූප අගයන් සහිතව පහත දැක්වේ.

| | 2011 වර්ෂය | | | 2010 වර්ෂය | | |
|---|---|---|---|---|---|---|
| | සංස්ථාව | සෞ.සේ.අ. | එකතුව | සංස්ථාව | සෞ.සේ.අ | එකතුව |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| පිරිවැටුම්/ සේවාගාස්තු | 4,794 | 12,523 | 17,317 | 3,508 | 10,969 | 14,476 |
| විකුණුම් පිරිවැය/ සෘජු වියදම් | 3,756 | 11,706 | 15,462 | 3,202 | 10,280 | 13,483 |
| දළ ලාභය | 1,038 | 817 | 1,855 | 989 | 688 | 1,677 |
| මෙහෙයුම් ලාභය | 525 | 413 | 939 | 466 | 351 | 817 |
| මූල්‍ය වියදම් | 1 | 422 | 423 | 7 | 325 | 333 |
| වෙනත් ආදායම් | 27 | 46 | 73 | 24 | - | 24 |
| ශුද්ධ ලාභය(බදු පෙර) | 524 | (8.5) | 516 | 458 | 25 | 484 |
| බදු වියදම් | 235 | - | 235 | 231 | 13 | 244 |
| ශුද්ධ ලාභය (බදු පසු) | 273 | (8.5) | 265 | 170 | 9 | 180 |

(ii) ඔසුසල් වල මූල්‍ය සමාලෝචනය

| | 2011 | 2010 | 2009 | 2008 | 2007 |
|---|---|---|---|---|---|
| ක්‍රියාත්මකව පැවති ඔසුසල් සංඛ්‍යාව | 25 | 25 | 23 | 21 | 20 |
| ඉපයූ ලාභය (රු. මිලියන) | 95.31 | 96.62 | 97.38 | 44.21 | 54.81 |
| පාඩු ලැබූ ඔසුසල් සංඛ්‍යාව | 09 | 06 | 04 | 10 | 08 |
| ලැබූ පාඩුව (රු. මිලියන) | 7.25 | 7.02 | 3.8 | 9.16 | 12.46 |

(ආ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී පාඩු ලැබූ ඔසුසල් සංඛ්‍යාව 06 සිට 09 දක්වා වර්ධනය වී තිබුණි. මෙය මුළු ඔසුසල් සංඛ්‍යාවෙන් 36% ක් විය.

(ඇ) පහත ඔසුසල් තුන වසර දෙකක හා තුනක සිට පාඩු ලබමින් තිබුණු අතර 2011 නොවැම්බර් මාසයේ බදුල්ල බස නැවතුම් පොල ඔසුසල වසා තිබුණි.

| | ලැබූ පාඩුව | | |
|---|---|---|---|
| | 2011 | 2010 | 2009 |
| | රු. | රු. | රු. |
| බදුල්ල - බස් නැවතුම්පොල | 2,187,893 | 1,419,707 | 1,893,568 |
| බදුල්ල - (ස.තො.ස) | 2,182,122 | 3,612,156 | - |
| හම්බන්තොට | 103,316 | 616,915 | 82,867 |

## 2.3 වියදම්වල වැඩිවීම

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වියදම් අයිතම 05 ක වැඩිවීමට මූලිකව බලපෑ හේතූන් සමඟ පහත දැක්වේ.

| වියදම් විෂය | 2011<br>රු. | 2010<br>රු. | වැඩි වූ ප්‍රතිශතය | හේතුව |
|---|---|---|---|---|
| කල්බදු වට්නාකම | 1,469,067 | 468,749 | 213% | නව ඔසුසල් ආරම්භ කිරීම හා වාර්ෂික කල්බදු ගාස්තුව වැඩි වීම. |
| වෘත්තිය ගාස්තු | 1,289,879 | 501,713 | 157% | ගිණුම් සහ අභ්‍යන්තර පාලන පද්ධති උපදේශක වෙනුවෙන් මසකට රු.100,000 බැගින් වෘත්තීය ගාස්තුවක් ගෙවා තිබීම. |
| අධ්‍යක්ෂක ගාස්තු | 348,750 | 54,000 | 546% | අධ්‍යක්ෂවරුන් සඳහා ගෙවන ගාස්තු සහ ප්‍රවාහන දීමනාව වැඩිවීම. |
| පරිත්‍යාග | 2,071,042 | 8,280 | 24913% | ගං වතුරින් අනාථ වූ පුද්ගලයින්ට බෙදා දීමට රු.මිලියන 1.5 ක වතුර බෝතල් මිලදී ගැනීම. |
| ඖෂධ පරීක්ෂණාගාර ගාස්තු | 735,568 | 136,447 | 439% | බාහිර ඖෂධ පරීක්ෂණාගාර මගින් 2011 වර්ෂය තුල පරීක්ෂණ සිදු කිරීම. |

## 2.4 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

| | | 2011 | 2010 | නිරීක්ෂණය |
|---|---|---|---|---|
| **(අ) ද්‍රවශීල අනුපාත** | | | | |
| ජංගම අනුපාතය | තථ්‍ය | 1.35 | 1.35 | ජංගම වගකීම් පියවීමට ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් ආයතනය සතුව නොතිබුණි. |
| | සම්මත | 2 | 2 | |
| ක්ෂනික වත්කම් අනුපාතය | තථ්‍ය | 0.88 | 0.71 | |
| | සම්මත | 1 | 1 | |
| **(ආ) ක්‍රියාකාර අනුපාතය** | | | | |
| ණයගැති පිරිවැටුම් අනුපාතය වාර | | 3 | 4 | ණය අයකර ගැනීම සතුටුදායක තත්ත්වයක නොතිබුණි. |
| ණයගැති පිරිවැටුම් කාලය දින | | 113 | 84 | එකතු කිරීමේ කාලය දින 29 කින් වැඩිවීම |

| | | | |
|---|---|---|---|
| තොග පිරිවැටුම් අනුපාතය වාර | 5 | 3 | සංස්ථාවේ තොගයට සාපේක්ෂව ඵලදායි විකුණුමක් සිදු නොවීම. |
| තොග පිරිවැටුම් කාලය දින | 72 | 100 | තොගය විකුණුම් බවට පත්වීමට දින 72 ක කාලයක් ගතවීම. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ

(අ) සංස්ථාව වෛද්‍ය සැපයීම් අංශයට සැපයූ රු. 153,725,956 ක් වටිනා ඖෂධ ප්‍රතික්ෂේප වී තිබූ අතර, ඒ අතරින් රු. 67,906,599 ක් වටිනා ඖෂධ තත්ත්වයෙන් අසමත්වද රු.72,179,561 ක වටිනා ඖෂධ පිරිවිතර දෝෂ මතද ප්‍රතික්ෂේප වී තිබුණි. විගණිත දිනය වන විට ඉහත තත්ත්වයෙන් අසමත් ඖෂධයන්ගෙන් රු.9,509,996 ක් වටිනා තොග හා පිරිවිතර දෝෂ මතද ප්‍රතික්ෂේප වී තිබූ රු.11,699,811 ක් වටිනා තොග වෛද්‍ය සැපයීම් අංශයට නැවත සැපයීමට ක්‍රියාමාර්ග ගෙන තිබුණි.

(ආ) ඖෂධ නිෂ්කාෂණය ප්‍රවාහනය හා ඖෂධ ගබඩා කර තබා ගැනීමේ සේවාව ලබා ගැනීමට, පෙර වර්ෂයේ ටෙන්ඩර් මිලට වඩා රු. 656,507 ක වැඩි අගයක් ඉදිරිපත් කළ කොන්ත්‍රාත් කරුට ටෙන්ඩරය ලබාදී තිබූ අතර ප්‍රතික්ෂේපිත / කල් ඉකුත්වූ තොග රඳවා ගැනීම සඳහා ගබඩා කුලී වශයෙන් සමාලෝචිත වර්ෂයේ මුල් මාස 3 ට රු. 3,295,481 ක් ගෙවා තිබුණි.

(ඇ) 2001- 2007 කාල පරිච්ඡේදයන්ට අදාල රු.12,869,527 ක තොග සහ 2009, 2010 හා සමාලෝචිත වසරට අදාල පිළිවෙලින් රු.19,466,338 ක හා රු.23,241,960ක හා රු.16,325,200 ක හානි වූ / අභාවිත තොග සඳහා රක්ෂණ හිමිකම් පෑමක් මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණද ඒ සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු අනාවරණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබූ බැංකු අයිරා පොලිය රු. මි. 419.24 ක වූ අතර එය පසුගිය වර්ෂයටවඩා 14%කින් වැඩිවීමකි.

(ආ) වටිනාකම විගණනයට ඉදිරිපත් නොවුනු 2010 දෙසැම්බර් 31 දිනට කල් ඉකුත් වූ ඖෂධ අයිතම 257 ක ඒකක 7,019,807 ක් ද, 2011 ජනවාරි සිට නොවැම්බර් දක්වා කල් ඉකුත් වූ ඖෂධ අයිතම 33 ක ඒකක 19,801 ක්ද, රත්මලානෙන් කුලියට ගත් ගොඩනැගිල්ලේ ගබඩා කර තිබුණි.

(ඈ) වෛද්‍ය සැපයීම් අංශය ඉල්ලුම් කර තිබණු Bone Cement Low Viscosity නමැති ශල්‍ය පාරිභෝජන ද්‍රව්‍යය වෙනුවට සංස්ථාව සපයා තිබුණේ රු.1,900,976 ක් වටිනා Bone Cement Medium Viscosity නමැති ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍යය බැවින් ඉල්ලුම් කළ පිරිවිතරවලට නොගැලපීම මත වෛද්‍ය සැපයීම් අංශය භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි.

(ඇ) වෛද්‍ය සැපයීම් අංශයට සැපයූ රු. 10,454,080 ක් වටිනා Ampicilling Injection BP 250 mg නමැති ඖෂධය සම්බන්ධයෙන් රෝහල්වලින් ලද පැමිණිලි මත ජාතික ඖෂධ තත්ත්ව පාලන රසායනාගාරය මගින් කළ පරීක්ෂණයේදී එම ඖෂධය තත්ත්වයෙන් අසමත් වී තිබූ බව තහවුරු වී තිබුණි.

(ඉ) Sodium Chloride Intravenous ඖෂධය නියමිත කාලය තුල නොසැපයීම සහ බාහිර ආයතනවල බහාලුම්වල ගබඩා කිරීම හේතුවෙන් ගෙවීමට සිදු වූ බහාලුම් ප්‍රමාද ගාස්තු හා නියමිත වේලාවට ලියවිලි නොලැබීම මත සංස්ථාව විසින් ගෙවූ සැපයුම්කරුවන්ගෙන් අය කර නොගත් ප්‍රමාද ගාස්තු වටිනාකම පිළිවෙලින් රු. 1,461,064 ක් හා රු. 3,758,675 ක් විය.

(ඊ) Closed Wound Suction Drainage System and Thoracic Chest Drainage Catheter නමැති ඖෂධ තොගය ආනයනයේදී අදාල පිරිවිතර සහ කොන්දේසිවලට අනුකූලදැයි තහවුරු කර ගැනීමට සංස්ථාව කටයුතු නොකිරීම නිසා වෛද්‍ය සැපයීම් අංශය ප්‍රතික්ෂේප කළ එම ඖෂධයෙන් සංස්ථාවට වූ පාඩුව රු. 3,332,738 ක.

(උ) වෛද්‍ය සැපයීම් අංශයට සැපයූ රු.229,233,142 ක් වටිනා Sodium Chloride Intravenous ඖෂධයේ අංක 306212147 දරන කාණ්ඩයට අයත් බෝතල් තුල ආගන්තුක ද්‍රව්‍යයක් අඩංගු බව අනාවරණය වන විටත් අදාල ඖෂධය භාවිතා කර අවසන්ව තිබුණි. එයින් රෝගීන්ට සිදුව තිබූ හානිය පිළිබඳව සමීක්ෂණය කර නොතිබුණි.

(ඌ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට හා සංස්ථාවේ අලෙවි කටයුතු සඳහා ගෙන්වූ ඖෂධ නියමිත කාලයේදී වරායෙන්නිදහස් කර නොගැනීම නිසා 2007 සිට 2011 දක්වා කාලය තුල එකතුව රු.119,003,021 ක් ප්‍රමාද ගාස්තු ලෙස ගෙවා තිබුණි.ගෙවන ලද ප්‍රමාද ගාස්ත ප්‍රමාණය ප්‍රකාශිත අවම මට්ටමක පවත්වා ඇති බව සභාපති දැනුම් දී ඇත.

3.3 හඳුනා ගන්නා ලද පාඩු

පහත සඳහන් පාඩු විගණනයේදී අනාවරණය විය.

(අ) ඖෂධ කල් ඉකුත්වීම, තත්ත්වයෙන් අසමත්වීම හා බිඳී තිබීම මත රු. 11,265,891 ක් වටිනා ඖෂධ විනාශකර තිබුණි.

(ආ) වෛද්‍ය සැපයීම් අංශය ඖෂධ භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම නිසා රු. 1,267,656 ක අමතර ප්‍රවාහන කුලී හා රු. 743,650 ක ප්‍රමාද කුලී ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) DHS/SU/003/01G/09 දරන ඇණවුමට අදාල පිරිවිතරයන් නොගැලපීම මත වෛද්‍ය සැපයීම් අංශය භාර නොගත් රු. 2,212,573 ක වටිනාකමින් යුත් ශල්‍ය පාරිභෝජන ද්‍රව්‍යවලට ගෙවූ මුදල නැවත අයකර ගැනීමට හෝ අදාල ඖෂධ ලබා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 අංක 10 දරන ආදායම් බදු පනතේ 138 වන වගන්තිය අනුව 2007 සිට 2010 දක්වා වූ වර්ෂ වල මතිමාත්‍ර බදු බැර (Notional Tax) නිවැරදිව නොගැලපීම නිසා රු. 447,864 ක මූල්‍ය පාඩුවක් සිදුවී තිබුණි.

(ඉ) ගබඩා පහසුකම් නොතිබීම මත වෛද්‍ය සැපයීම් අංශය භාර නොගත් DHS/JA/304/10 හා 484/10 දරන ඇනවුමට අදාල ඖෂධ බෝතල් 323,500 ක පෞද්ගලික ගබඩාවක ගබඩා කිරීමට සිදු වීමෙන් රු. 1,597,480 ක් වටිනා බෝතල් 37,325 ක් සම්පූර්ණයෙන්ම වැස්සට හසු වී විනාශ වී තිබුණි.

(ඊ) මීගමුව ඔසුසැලේ රු. 3,863,610 ක අලෙවි ආදායමක් බැංකු ගත කළ බවට සාවද්‍ය ලේඛන සකස් කර වංචා කර තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ සංයුක්ත සැලැස්මෙහි ඉටු කර ගත යුතු අරමුණු අතරින් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම, කොළඹ 07 නව ගොඩනැගිල්ලට රසායනාගාර පහසුකම් සැපයීම, රත්මලාන නව ඖෂධ ගබඩාව ඉදි කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය තුල ඉටුකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි.

### 4.2 ක්‍රියාකාර සැලැස්ම

ක්‍රියාකාර සැලැස්මේ පහත සඳහන් ක්‍රියාකාරකම් නියමිත කාලය තුල දී ඉටු කර ගැනීමට නොහැකිව තිබුණි.

| කාර්යයන් | ක්‍රියාකාර සැලැස්ම අනුව ඉටු කර ගැනීමට අපේක්ෂිත කාලය |
|---|---|
| i. පුත්තලම, ගම්පහ, මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි රාජ්‍ය ඔසුසල් ඇරඹීම සඳහා ස්ථාන හඳුනා ගැනීම. | 2011 පළමු කාර්තුව අවසානයේදී |
| ii. තත්ත්ව පරීක්ෂණාගාරය සඳහා එක් විශ්ලේෂකයකු සහ තත්ත්ව පාලන සහායකයින් දෙදෙනෙකු බඳවා ගැනීම. | 2011 ජුනි |
| iii. තත්ත්ව පරීක්ෂණාගාරයේ කටයුතු වලින් කොටසක් ජාතික අන්තරාදායක ඖෂධ පාලන අධිකාරියට ලබාදීම. | 2011 අගෝස්තු |

### 4.3 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය විසින් විකුණුම් පද්ධතිය, ප්‍රසම්පාදන කටයුතු හා තොග පාලන අංශවල අභ්‍යන්තර පාලන පද්ධතීන් පරීක්ෂාවට ලක් නොකර ඔසුසල් විගණනයට වැඩි අවධානය යොමු වී තිබුණි.

4.4 ප්‍රසම්පාදන සැලැස්ම
----------------------

සමාලෝචිත වර්ෂයට ප්‍රසම්පාදන සැලැස්මක් සංස්ථාව විසින් ස්ථාපනය කර නොතිබූ අතර 2012 වසරට එය ස්ථාපනය කර තිබුණි.

4.5 අයවැය ලේඛනමය පාලනය
-------------------------------

අයවැයගත හා තත්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේතයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) විකුණුම්
(ආ) තොග
(ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(ඈ) ණයගැති පාලනය හා අයකර ගැනීම්
(ඉ) වාර්තා යාවත්කාලීන කිරීම
(ඊ) තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය
(උ) ඔසුසල් වල එකතු වන මුදල් බැංකු ගත කිරීම